# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1790/11 - 2012 දෙසැම්බර් මස 26 වැනි බදාදා - 2012.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වැනි වගන්තිය යටතේ, උප සභාපති වන කොනගෙදර විජේරත්න නම් වූ උප සභාපති අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා රණවීර මුදියන්සේලාගේ ප්‍රභාත් දුමින්ද රණවීර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රණවීර මුදියන්සේලාගේ ප්‍රභාත් දුමින්ද රණවීර මහතා දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
දෙහිඅත්තකන්ඩිය ප්‍රාදේශීය සභාව.

2012 දෙසැම්බර් මස 20 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

01 - 358